**පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් - 2021/ 2022**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

පීපල්ස් මයික්‍රෝ කොමර්ස්ලිමිටඩ්(“සමාගම“)හි2022මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා ලබා ගන්නා ලදි.
සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින්2022මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා සමාගම විසින් පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනලදවිගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කර ක්‍රියාත්මක කරන ලදී . වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතාකරනලදගිණුම්කරණප්‍රතිපත්තිවලඋචිතභාවය,ගිණුම්කරනඇස්තමේන්තුවලසාධාරණත්වයසහ කළමනාකරණයවිසින්කරනලදසම්බන්ධිතහෙළිදරව්කිරීම්අගයනලදී.
- සිද්ධීන්හෝතත්ත්වයන්හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වීඇතිබවසහහෙළිදරව්කිරීම්ඇතුලත්මූල්‍ය ප්‍රකාශනවලසමස්ථඉදිරිපත්කිරීමඅගයනලදී.
  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.
- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම්අදාළලිඛිතනීතියකටහෝසමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,
- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමාගම කටයුතු කර ඇති බව,
- සම්පත්සකසුරුවම්ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව සමාගම ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීමසම්බන්ධ විගණන නිරීක්ෂණ

### 1.5.1. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. සමාගමේ හානිකරණ ක්‍රියාවලිය අතින් සිදුකරන ක්‍රියාවලියකි. මෙම ක්‍රියාවලියේදී, හානිකරණය ගණනය කිරීම සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමට කළමනාකරණය අභ්‍යන්තර | හානිකරණය ගණනය කිරීමේ ක්‍රමවේදයේ සංකීර්ණත්වය හේතුවෙන් සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීයකරණය කරන ලද පද්ධතියක් සංවර්ධනය කිරීම අපහසු වේ. කෙසේ වෙතත්, ගණනය | හානිකරණය ගණනය කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීමට හා දත්ත මඟ හැරීම හා හැසිරවීමෙන් විය හැකි අවදානම වළක්වා ගැනීම සඳහා අතින් මැදිහත්වීම හැකි තරම් අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීමට |

| | | | |
|---|---|---|---|
| | වාර්තා කිහිපයක් ජනනය කරයි. වැඩිපුර අතින් කිරීම සහ තනි වේදිකාවක් තුළට වාර්තා කිහිපයක් ඒකාබද්ධ කිරීම ඇතුළත් මෙම ක්‍රියාවලිය මගින් අත්හැරීම්, වැරදි ප්‍රකාශනයන් හා මානව වැරදිවලට හේතුවිය හැකිය. | කිරීම්වලට සහායවීමට, පද්ධතිය මගින් ජනනය කරන වාර්තා සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියේ අපි යෙදී සිටිමු. | යෝජනා කරනු ලැබේ. මීට අමතරව, මෙය විවිධ මූලාශ්‍රවලින් දත්ත උපුටා ගැනීමට හා ඒවා සම්පාදනයට ගත කරන විශාල කාල ප්‍රමාණයක් ඉතිරි කරයි. |
| ii. | සමාගම දෙන ලද පැහැරහැරීමේ අලාභය (LGD) ගණනය කිරීම සඳහා පසුගිය වර්ෂ තුනෙහි සියලු අක්‍රීය ණය හා වැසූ කල්බදු පහසුකම් ගෙන තිබේ. | සමාගම LGD තීරණය කිරීමට පසුගිය වර්ෂ තුනක දත්ත දැන් භාවිතා කරයි. කෙසේ වෙතත්, අනාගතයේදී දත්තවල සුලබතාවය සැලකිල්ලට ගෙන LGD ශක්තිමත් කිරීම සඳහා වැඩිපුර දත්ත ඇතුළත් කිරීමට සමාගම සැලකිල්ල දක්වනු ලැබේ. | සමාගම, වඩාත් නිවැරදි LGD ලබාගැනීම සඳහා අදාල දත්තවල සුලබතාවය අනුව, LGD ගණනය කිරීම සඳහා පසුගිය වර්ෂ පහක සියලු අක්‍රීය ණය හා වැසූ කුලී සින්නක්කර පහසුකම් සැලකිල්ලටගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.276,623,242 ක බදු පෙර ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ අනුරූප ලාභය රු.202,056,281 ක් විය.එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.74,566,961 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ණය හා ලැබිය යුතු දෑ සඳහා හානිකරණ වියදම රු.74,486,836 කින් අඩුවීම, පොලී වියදම රු. 33,107,377 කින් අඩුවීම, පොලී ආදායමේ රු.25,840,702 කින් අඩුවීමට සාපේක්ෂව, ගාස්තු හා කොමිස් ආදායමේ රු.13,991,903 ක වැඩිවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන හේතු විය.

### 2.2. ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

**2.2.1** සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක සමාගමේ මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශයක් පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | 2021/22 | 2020/2021 | 2019/2020 | 2018/2019 | 2017/2018 |
|---|---|---|---|---|---|
| පොලී ආදායම (රු) | 793,186,355 | 819,027,057 | 795,054,678 | 676,325,915 | 519,381,024 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම/ (අඩුවීම) (%) | (3.16) | 3.02 | 17.55 | 30.22 | - |
| පොලී වියදම් (රු) | 184,907,941 | 218,015,318 | 265,159,407 | 240,935,082 | 198,966,597 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම / (අඩුවීම) (%) | (15.19) | (17.78) | 10.05 | 21.09 | - |
| බදු පෙර ලාභය (රු) | 276,623,242 | 202,056,281 | 48,974,530 | 87,443,094 | 44,666,225 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම / (අඩුවීම) (%) | 36.90 | 312.57 | (43.99) | 95.77 | - |

**2.2.2** සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල විශ්ලේෂණයක් පසුගිය වර්ෂය සමඟ සසඳා, වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතයන් සහිතව පහත වගුවේ දැක්වේ.

| විස්තරය | විචලනයේ වටිනාකම වැඩිවීම/(අඩු වීම)<br>(රු) | විචලනය<br>% | විචලනය සඳහා හේතු |
|---|---|---|---|
| හානිකරණ වියදම | (74,486,836) | (62.09) | ප්‍රකාශිත සියයට 62.09 ක අඩුවීම මඟින් ආදායම් ප්‍රකාශනය මත ඉදිරිපත් කරන ලද හානිකරණ වටිනාකමේ අඩුවීම පිළිබිඹු කරයි. සටහන්වල පැහැදිලි කරන පහත දැක්වෙන වර්ග තුන එම වටිනාකම තුළ ඇතුළත් වේ.<br>• ණය හා කුලී සින්නක්කර හානිකරණය<br>• අයකිරීම්වලින් ශුද්ධ ලියාහැරීම්<br>• ඉවත්කිරීමේ අලාභ<br>2020/2021 මූල්‍ය වර්ෂයේ, ලියාහැරීම්වල වටිනාකම හානිකරණ වටිනාකමේ ඇතුළත් කර ඇති අතර 2021/22 මූල්‍ය වර්ෂයේ ලියාහැරීම් වටිනාකමක් නොමැත. ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන හානිකරණ වටිනාකම අඩුවීම සඳහා ප්‍රධාන හේතුව මෙය වේ. අපි ණය හා කුලී සින්නක්කර හානිකරණ වියදම වෙනමම සලකන්නේ නම් එය 2020/2021 වර්ෂයට සාපේක්ෂව සියයට 10 ක වැඩිවීමක් පෙන්වනු ලැබේ. |
| ණය හා ලැබිය යුතු දෑ සඳහා ගාස්තු | (33,107,377) | (15.19) | i. සියලු ණය විචල්‍ය අනුපාත යටතේ ලබාගෙන ඇති අතර 2020/2021 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 2021/2022 මූල්‍ය වර්ෂයේ පළමු මාස 6 ඇතුළත පොලී අනුපාත (AWPLR) අඩුවීම, ණය හා ලැබිය යුතු දෑ සඳහා ගාස්තු අඩුවීම සඳහා ප්‍රධාන හේතුව විය.<br>ii. එසේම, 2020/21 මූල්‍ය වර්ෂයේදී පීඑල්සී ණය හා සණස ණය පියවන ලදි. |
| ගාස්තු හා කොමිස් ආදායම | 13,991,903 | 28.57 | ගාස්තු හා කොමිස් ආදායම නව ණය ලබාදීම මත රඳා පවතී. 2020/21 මූල්‍ය වර්ෂයේදීCOVID 19 වසංගතය ව්‍යාප්තිය හේතුවෙන් නව ව්‍යාපාරවල අනුමතකිරීම් නතර කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2020/21 මූල්‍ය වර්ෂයේදී ව්‍යාපාර සම්බන්ධ ගාස්තු හා කොමිස් ආදායම අඩු වූ අතර, 2021/22 වර්ෂයේදී තත්වය ක්‍රමිකව සාමාන්‍යකරණය විය. එබැවින්, 2021/2022 මූල්‍ය වර්ෂයේදී 2020/21 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව ගාස්තු හා කොමිස් ආදායම වැඩිවී ඇත. |
| වෙනත් මෙහෙයුම් වියදම් | 10,699,239 | 8.06 | 2020/21 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 2021/22 මූල්‍ය වර්ෂයේදී ප්‍රදානය කිරීම් වැඩිවීම හේතුවෙන් විකුණුම් සම්බන්ධ වියදම් ද සියයට 29 කින් වැඩිවිය. පසුගිය මූල්‍ය වර්ෂයට සාපේක්ෂව වැඩි වූ වෙනත් ප්‍රධාන මෙහෙයුම් වියදම් පහත දැක්වේ. |

i. ශාඛා කුලිය - කටුගස්තොට පිහිටි තනි ශාඛාවට සම්බන්ධ කුලිය, 2021/22 මූල්‍ය වර්ෂයේ මෙහෙයුම් වියදම්වල සම්පූර්ණයෙන් ඇතුළත් වේ. (සමාගම 2021 ජනවාරි මාසයේදී කටුගස්තොට පිහිටි නව තනි ශාඛාව ආරම්භ කරන ලදි)

ii. සමාගම ශාඛා තරහාවලියක් පැවැත්වූ අතර ජයග්‍රාහකයන්ට සම්බන්ධ පිරිවැය 2021/22 මූල්‍ය වර්ෂයේ මෙහෙයුම් වියදම්වල ඇතුළත් වේ.

## 2.3 අනුපාත විශ්ලේෂණය

ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ සමාගමේ සමහර වැදගත් අනුපාත පහත දැක්වේ.

| විස්තරය | 2021/2022 | 2020/2021 |
|---|---|---|
| ශුද්ධ ලාභ අනුපාතය | 22.99% | 15.29% |
| හිමිකම් මත ප්‍රතිලාභය (ROE) | 37.96% | 36.09% |
| වත්කම් මත ප්‍රතිලාභය (ROA) | 6.41% | 4.94% |
| ණය හිමිකමට අනුපාතය | 4.92 | 6.30 |